# මුදල් කොමිෂන් සභාව - කාර්යසාධන වාර්තාව

# (2017.07.01 සිට 2017.09.30 දක්වා)

**1. අවශ්‍යතා තක්සේරුව - 2018**

ප්‍රාග්ධන හා පුනරාවර්තන අයවැය මත පළාත් විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය අවශ්‍යතාවයන් සමාලෝචනය කිරීම සඳහා අදාල පළාත් බලධාරීන් සමග රැස්වීම් පවත්වන ලදී . එම රැස්වීම්වලදී, මුදල් කොමිෂන් සභාව සහ එකිනෙක පළාත විසින් තක්සේරු කරන ලද මූල්‍ය අවශ්‍යතාවයන් පිළිබඳව දෙපාර්ශවයම පොදු එකඟතාවයකට පැමිණෙන ලදී.

ඒ අනුව, 2018 වර්ෂය සඳහා පළාත් අයවැය අවශ්‍යතාවය මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත දැනුම් දෙන ලදී.

**2. 2018 වර්ෂය සඳහා නිර්දේශ**

- 2018 වර්ෂයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා අරමුදල් බෙදා වෙන් කිරීම සම්බන්ධයෙන් භාෂාත්‍රයෙන් සකස්කරන ලද 2018 වර්ෂයට අදාල නිර්දේශය ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී.
- මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ මත පදනම්ව මහා භාණ්ඩාගාරය විසින් පළාත් වෙත වෙන් කරනු ලබන මුළු අරමුදල් ප්‍රමාණය තීරණය කරනු ලබයි.

**3. පළාත් සංවර්ධන සැලසුම් සංශෝධනය කිරීම - 2017**

පළාත් විසින් කරනු ලැබූ ඉල්ලීම් මත පදනම්ව, 2017 වර්ෂයේ සංවර්ධන සැලසුම්වල පුළුල් ක්‍රියාකාරකම් පරාසය දක්වා ඉදිරිපත් කරන ලද සංශෝධන සඳහා ප්‍රතිපත්තිමය එකඟතාවය ලබාදී ඇත.

**4. මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2016**

2016 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සකස්කර ඉංග්‍රීසි, සිංහල හා දෙමළ යන භාෂාත්‍රයෙන්ම මුද්‍රණය කර ඇති අතර එය අතිගරු ජනාධිපතිතුමා සහ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

**5. පළාත් විගණන වාර්තා සඳහා වාර්තා සකස් කිරීම**

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් එවන ලද ඌව පළාතේ සහ වයඹ පළාතේ විගණන වාර්තා අධ්‍යයනය කරන ලද අතර, ප්‍රධාන කරුණු ගරු ආණ්ඩුකාරවරුන්, ප්‍රධාන ලේකම්වරුන් සහ විගණකාධිපති වෙත යොමු කර ඇත.

## 6. නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය

**පුහුණුවීම්**

- මුදල් කොමිෂන් සභාවේ අදාල නිලධාරීන් සඳහා පහත තෝරාගත් ක්ෂේත්‍රයන් යටතේ පුහුණු අවස්ථා ලබා දී ඇත.

  - ✓ පුස්තකාල කළමනාකරණය
  - ✓ සේවක පඩි ලැයිස්තුව
  - ✓ ලංසු පත්‍රිකා සැකසීම
  - ✓ ගොනු කළමනාකරණය සහ කාර්යාල පරිපාලනය
  - ✓ Microsoft Excel- වැඩිදියුණු කරන ලද විශ්ලේෂණ මෙවලම්
  - ✓ ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS)

**රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය (PPP) සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව (ToT)**

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව හා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID) විසින් 2017 අගෝස්තු මස 28 සිට 31 වන දින දක්වා කොළඹ හිල්ටන් හෝටල් පරිශ්‍රයේදී මෙම වැඩමුළුව පවත්වන ලදී. වැඩමුළුව සඳහා මුදල් කොමිෂන් සභාවේ සභාපති සහ නිලධාරීන් දෙදෙනෙක් සහභාගී වන ලදී. මෙම වැඩමුළුව රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයේ ශක්‍යතාවය ගොඩනැගීමේ ප්‍රයත්නයෙහි තිරසාරභාවය සහතික කරලීමේ වෑයමක් විය.

**පළාත් සැලසුම්කරණ යාන්ත්‍රණයේ ධාරිතාවය සංවර්ධනය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමග සහයෝගිතාවය**

පළාත් සැලසුම්කරණ යාන්ත්‍රණයේ ධාරිතාවය සංවර්ධනය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමග සහයෝගිතාවය ඇතිකර ගැනීම උදෙසා මූලික සාකච්ඡාව පවත්වන ලදී. 2018 වර්ෂයට අදාල සැලසුම් මාර්ගෝපදේශ සකස් කිරීම පිණිස විශේෂඥ සහය ලබාදීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් අදාල විෂය ක්ෂේත්‍රය (TOR) ඉදිරිපත් කරනු ලැබූ අතර, එයට මුදල් කොමිෂන් සභාව විසින් එකඟතාවය පළකරන ලදී.

## 7. ජපාන ජාත්‍යන්තර සහයෝගිතා සංවිධානය (JICA) සමග සිදුකරන ලද සාකච්ඡා

- මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා JICA සහය ලබාගැනීමට ඇති විභවතාවය හඳුනාගැනීම සඳහා එම ආයතනය සමග සාකච්ඡාවක් පවත්වන ලදී. මෙම සාකච්ඡාව සඳහා JICA හි කර්මාන්ත සංවර්ධන හා රාජ්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ උපදේශක සකානෝ තායිචි මහතා සහ JICA හි ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ උපායමාර්ගික සැලසුම්කරණ උපදේශක හොන්ඩා සුරිචිරෝ මහතා සහභාගිවන ලදී.

## 8. ආරාධිත දේශකයන්

- ලොවා විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සහ ආර්ථික හා මිල ස්ථායිතාවය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු සහකාර අධිපතිවරයෙකු වන ආචාර්ය එච්.එන්.තේනුවර මහතා විසින් රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූල්‍ය පිළිබඳව දේශනයක් පවත්වන ලදී. එම දේශනයේ දී ප්‍රතිපත්ති අවශ්‍යතාවය, ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ පියවර, ප්‍රතිපත්ති පිළිගැනීම සහ රජයේ ආර්ථික කටයුතු වැනි ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය කරන ලදී.





- USAID හි රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව සහ ප්‍රසම්පාදන උපදේශක සරත් මුතුගල මහතා විසින් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයේ අවශ්‍යතාවය, ශ්‍රී ලංකාවේ නූතන පෞද්ගලික ආයෝජනය, සාම්ප්‍රදායික මූල්‍යයේ සහ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයේ ප්‍රභේදවල වෙනස්කම් සහ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයේ මූලධර්ම පිළිබඳව අවධානය යොමුකරමින් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

## 9. අධ්‍යයන චාරිකා

- ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීමට අදාලව මුදල් කොමිෂන් සභාවේ කාර්යයන් සහ කාර්යභාරය අධ්‍යයනය කිරීම සඳහා නේපාල රජයේ නිලධාරීන් හය දෙනෙකු සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ආධුනික නිලධාරීන් කණ්ඩායමක් මුදල් කොමිෂන් සභාවට පැමිණෙන ලද අතර, එහිදී නිර්දේශ ඉදිරිපත් කිරීම, පළාත් සඳහා සැලසුම්කරණ සහ අයවැයකරණ ක්‍රියාවලිය, පළාත් වෙත ලබාදෙන ලද ප්‍රදාන,පළාත්වල ආදායම් මූලාශ්‍ර, පළාත් පාලන ආයතන මූල්‍යකරණය, පළාත් කාර්යමණ්ඩලය යනාදිය සම්බන්ධයෙන් ඔවුන් වෙත ඉදිරිපත් කිරීමක් කරන ලදී.




- දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ කාර්යභාරය, ක්‍රියාකාරිත්වය සහ ගැටළු අධ්‍යයනය කිරීම සඳහා මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් අධ්‍යයන චාරිකාවක නිරත වන ලදී. එම අධ්‍යයනයේදී සංවිධාන ව්‍යුහය, ආදායම් මූලාශ්‍ර, කාර්යමණ්ඩල කළමනාකරණය, අයවැයකරණ ක්‍රියාවලිය, සංවර්ධන ව්‍යාපෘති, පුස්තකාල කළමනාකරණය, අපද්‍රව්‍ය කළමනාකරණය, පෙර පාසල් අධ්‍යාපනය සහ සුභසාධන වැඩසටහන්, ඉතුරුම් සහ ආයෝජන යන ප්‍රධාන ක්ෂේත්‍රයන් ආවරණය කරන ලදී.





**10.** **මුදල් කොමිෂන් සභාව සඳහා නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු**

මුදල් කොමිෂන් සභාවේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු මේ වන විටත් සිදුවෙමින් පවතී. ව්‍යාපෘතියේ උපදේශන ඒකකය (මොරටුව විශ්වවිද්‍යාලයේ වාස්තු විද්‍යා පීඨය) සහ කොන්ත්‍රාත්කරුගේ සහභාගිත්වයෙන් වැඩ භූමියේ දී තාක්ෂණික කමිටු රැස්වීම් තුනක් සහ මුදල් කොමිෂන් සභාවේ දී ප්‍රගති සමාලෝචන රැස්වීම් තුනක් පවත්වා ඇත. අනුමත ඇස්තමේන්තුගත මුළු මුදල වන රු.මි. 300 න් සැප්තැම්බර් මස 30 වන දින දක්වා වියදම රු.මි 107 කි. මෙම වැඩසටහනෙහි සැලසුම් කළ කාල රාමුවට අනුව දින 115 ක පමණ ප්‍රමාදයක් නිරීක්ෂණය වේ. මෙම දිගු ප්‍රමාදය හේතුවෙන් සතිපතා ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කරන ලෙසට කොමිෂන් සභාව විසින් ව්‍යාපෘතියේ උපදේශන ඒකකයෙන් ඉල්ලීමක් කර ඇත.



**11.** **මුදල් කොමිෂන් සභා දත්ත පද්ධතිය හා කළමනාකරණ තොරතුරු පද්ධතිය**

මුදල් කොමිෂන් සභාවේ වැඩ කටයුතු කරගෙනයාමේ දී දත්ත පද්ධතිය හා කළමනාකරණ තොරතුරු පද්ධතිය ඉතා වැදගත්වේ. දත්ත පද්ධතිය හා කළමනාකරණ තොරතුරු පද්ධතිය සම්බන්ධයෙන් ආසියානු පදනම (TAF) මුදල් කොමිෂන් සභාව වෙත සහාය වීම සඳහා එකඟතාවය දක්වා ඇත. ඒ අනුව තොරතුරු හා සන්නිවේදන තොරතුරු පද්ධතිය පුළුල් ලෙස සකස් කර ගැනීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සමඟ සාකච්ඡා කර ඇත.

**12.** **මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත**

2016 නොවැම්බර් මස 09 වන දින මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත අතිගරු ජනාධිපතිතුමන් වෙත ඉදිරිපත් කරන ලදී. ජනාධිපති ලේකම් කාර්යාලය විසින් මෙම පනත් කෙටුම්පත

සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කර තිබේ. මුදල් කොමිෂන් සභා පනතේ කෙටුම්පත අවසන් කිරීම ප්‍රමාදවී තිබීම නිසා ජනාධිපති අතිරේක ලේකම් (නීති) හමුවී 2017 ජූලි මස 18 වන දින සාකච්ඡා කරන ලදී. කෙසේ වුවද, ජනාධිපති ලේකම් කාර්යාලයේ අතිරේක ලේකම් (නීති) විසින් ඉදිරිපත් කරන ලද ප්‍රධාන කරුණු කිහිපයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව එකඟ නොවූ අතර, නැවත සලකා බැලීම සඳහා 2017 සැප්තැම්බර් මස 12 වන දින අපගේ අදහස් ඉදිරිපත් කර ප්‍රතිඵල අපේක්ෂාවෙන් පසුවේ.

## 13. විගණන කමිටුව පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම

කළමනාකරණ හා විගණන කමිටුව පිහිටුවන ලදී. දෙවන රැස්වීම විගණන අධිකාරී සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයකුගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. අවශ්‍ය පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා රැස්වීමේදී ගනු ලැබූ තීරණ මුදල් කොමිෂන් සභාවේ සියළු කාර්ය මණ්ඩලය වෙත දන්වන ලදී.

## 14. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ එක්ව සැලසුම් කිරීම හා අධික්ෂණය සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම

ජාතික හා උප ජාතික මට්ටමින් ඒකාබද්ධ සැලසුම්කරණ යාන්ත්‍රණයක් හඳුන්වාදීමේ අරමුණින් කෙටුම්පත් කරන ලද සංකල්ප පත්‍රිකාවක් හා එක් එක් අංශ සඳහා සංරචක හා උප සංරචක ඔස්සේ සැලසුම්කරණ ආකෘති පත්‍ර සකස් කර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සාකච්ඡා කර ඇත. එය තව දුරටත් සංවර්ධනය කළ යුතු අතර, අදාල අනෙකුත් ආයතන සමඟ සාකච්ඡා කළ යුතුවේ.

## 15. වයඹ පළාතේ දැනට ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් හා ඉදිරි සංවර්ධන සැලසුම් පිළිබඳව සාකච්ඡා කිරීම හා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා 2017 අගෝස්තු මස 17 හා 18

සංවර්ධන වැඩසටහන් වල ප්‍රගති සමාලෝචනය, කාර්ය මණ්ඩල භාවිතය හා ප්‍රතිපත්තිමය ගැටළු ජාතික මට්ටමින් සළකා බැලීම සඳහා මුදල් කොමිෂන් සභාවේ සභාපති, ලේකම් ඇතුළු නිලධාරීන් සමඟ වයඹ පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමන්, ගරු අමාත්‍යවරුන්, වයඹ පළාතේ ප්‍රධාන ලේකම්, පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සහභාගිත්වයෙන් මෙම සාකච්ඡාව පවත්වන ලදී.

තවද, ගල්ගමුව මූලික රෝහල, අඹන්පොල පිහිටි කෘෂිකර්මික හා සත්ව ගොවිපලවල්, වාරියපොල පෙර පාසල හා වාරියපොල ප්‍රාදේශීය සභාව, වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ඇති කුලියාපිටිය රජයේ රැඳවුම් නිවාසය හා කොබෙයිගනේ ජල යෝජනා ක්‍රමය යනාදීයේ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සමාලෝචනය සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් 2017 අගෝස්තු මස 17 හා 18 යන දිනයන් හි සිදුකරන ලදී. එහිදී ඇතැම් ව්‍යාපෘතිවල පැවති ගැටළු නිරීක්ෂණය සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදී.



**ගල්ගමුව මූලික රෝහල**



**කසල කළමනාකරණ මධ්‍යස්ථාන – ගල්ගමුව හා වාරියපොල**

**16. පරිවාස හා ළමා රක්ෂක අංශය පිළිබඳ කරුණු සාකච්ඡා කිරීම**

පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තු කොමසාරිස්වරුන්ගේ හා පළාත් පරිවාස හා ළමාරක්ෂක අමාත්‍යාංශ ලේකම් වරුන්ගේ රැස්වීම 2017 සැප්තැම්බර් මස 15 වන දින මුදල් කොමිෂන් සභාවේදී පවත් වන ලදී.

පළාත් මට්ටමේ පවතින ගැටළු හා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට පළාත් නියෝජිතයන්හට අවස්ථාවක් ලබාදීම මෙම රැස්වීම පැවැත්වීමේ ප්‍රධාන අරමුණ විය.

**17. ජාතික හා පළාත් මට්ටමේ මනා සම්බන්ධීකරණය තුළින් සංවර්ධන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම පිළිබඳ වැඩමුළුව පසු විපරම් කිරීම**

2015 ජුනි මස 15 වැනි දින පවත්වන ලද මෙම වැඩමුළුවේ තීරණ හා නිර්දේශ පසු විපරම් කිරීමට කොමිෂන් සභාව විසින් හඳුනාගත් ගැටළු සහ නිර්දේශ මත පදනම්වූ පිරික්සුම් ලැයිස්තුවක් සකස් කරන ලදී. එම පිරික්සුම් ලැයිස්තුව, ක්‍රියාකාරකම් සැලසුම සමග ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද අතර ජනාධිපති ලේකම් විසින් එම වැඩමුළුවේ ප්‍රගතිය හා නිර්දේශ සාකච්ඡා කිරීමට 2017 සැප්තැම්බර් මස 15 වැනි දින රැස්වීමක් කැඳවීය. අදාල අමාත්‍යාංශ සහ අනෙකුත් අදාළ ආයතන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙම රැස්වීමට සහභාගි වූහ. ජනාධිපති කාර්යාලය විසින් කරන ලද ඉල්ලීමකට අනුව මුදල් කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධයෙන් ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

**18. මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාව**

2017 වර්ෂයේ දෙවන කාර්තුවේ මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

**19. විශේෂ අධ්‍යයනයන්**

මුදල් කොමිෂන් සභාවේ කටයුතු සඳහා සහාය දැක්වීමට විශේෂ අධ්‍යයන ගණනාවක් සිදු කරන ලදී. ඒවා අතරට ඇතුළත් වන්නේ:

- මහ නගර සභා කිහිපයක් අධ්‍යයනය
- ප්‍රාග්ධන අරමුදල් උපයෝජනය
- මහ නගර සභාවල මූල්‍ය අසමතුලිතතාවය පිළිබඳ අධ්‍යයනය
- තුලිත ප්‍රාදේශීය සංවර්ධනය අර්ථ දැක්වීම

**20. කොමිෂන් සභා රැස්වීම් / විධායක නිලධාරීන්ගේ රැස්වීම් / කාර්ය මණ්ඩල රැස්වීම්**

- **කොමිෂන් සභා රැස්වීම් -** 2017 ජුලි 07, 2017 අගෝස්තු 03 (විශේෂ රැස්වීම), 2017 අගෝස්තු 19 හා 2017 සැප්තැම්බර් 30.
- තීරණ ගැනීම හා පසු විපරම් කටයුතු පහසුකිරීම පිණිස උප කමිටුවක් පිහිටුවන ලදී. සෑම කොමිෂන් සභා රැස්වීමක් පැවැත්වීමට පෙර මෙම උප කමිටුව රැස්වෙනු ලබයි.

- **විධායක නිලධාරීන්ගේ රැස්වීම් -** සතිපතා විධායක නිලධාරීන්ගේ රැස්වීම් පවත්වනු ලබයි.

- **කාර්යමණ්ඩල රැස්වීම් -** 2017 ජුලි 13, ජුලි 21, ජුලි 26 හා සැප්තැම්බර් 07 යන දිනවල කාර්යමණ්ඩල රැස්වීම් පවත්වා ඇත.